# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2025

| විෂය අංකය<br>பாட இலக்கம் | 29 | විෂයය<br>பாடம் | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 5 | 31. | 1 | 41. | 4 |
| 02. | 5 | 12. | 2 | 22. | 3 | 32. | 2, 2 1 | 42. | 3 |
| 03. | 2 | 13. | 3 | 23. | 4 | 33. | 5 | 43. | 2 |
| 04. | 3 | 14. | 2 | 24. | 1 | 34. | 4 | 44. | 1 |
| 05. | 3 | 15. | 5 | 25. | 4 | 35. | 1 | 45. | 4 |
| 06. | 1 | 16. | 4 | 26. | 3 | 36. | 4 | 46. | 4 |
| 07. | 4 | 17. | 3 | 27. | 5 | 37. | 5 | 47. | 5 |
| 08. | 1 | 18. | 2 | 28. | 1 | 38. | 1 | 48. | 3 |
| 09. | 4 | 19. | 5 | 29. | 2 | 39. | 5 | 49. | 2 |
| 10. | 2 | 20. | 3 | 30. | 2 | 40. | 4 | 50. | 3 |

✪ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 50 = 50



CamScanner

# 29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## II පත්‍රය

| | | |
|---|---|---|
| 1. (i) | වර්තමාන සමාජය තුළ භාවිත කරන අවිධිමත් සන්නිවේදන ක්‍රම **දෙකක්** නම් කරන්න. | (ලකුණු 04) |

ඔපදූප, කටකතා, කැළෑ පත්තර, කෝලම් **ලකුණු 2 x 2 = 04**

| | | |
|---|---|---|
| (ii) | අතථ්‍ය සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. | (ලකුණු 08) |

- අධ්‍යාපන කාර්යය සඳහා
- සම්බන්ධතා ගොඩනගා ගැනීමට
- ව්‍යාපාරික කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමව සිදුකර ගැනීම සඳහා
- ප්‍රචාරක කටයුතු සඳහා
- නිර්මාණාත්මක කාර්යයේ දී සඳහා චින්තනය පුබුදුවාලීම සඳහා

**ලකුණු 4 x 2 = 08**

| | | |
|---|---|---|
| (iii) | සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයක් ලෙස ජන කවියෙහි දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** උදාහරණ සහිතව විස්තර කරන්න. | (ලකුණු 12) |

- මුඛ පරම්පරාගතව පැවත ඒම
- සරල බස්වහරක් භාවිත කිරීම
- නිර්මාණකරුවා කවරෙක්දැයි හඳුනාගත නොහැකිවීම
- ඒ ඒ ප්‍රදේශයට ආවේණික ලක්ෂණවලින් සමන්විතවීම
- දීර්ඝ කාලයක් මුළුල්ලේ මිනිසුන් අතර ජනශ්‍රැතියක් ලෙස පැවතීම
- නිර්මාණය සඳහා ජීවන අත්දැකීම් පාදක කර ගැනීම

**විස්තර කිරීමට ලකුණු 3 x 3 = 09**
**උදාහරණ දැක්වීම ලකුණු 1 x 3 = 03**
**මුළු ලකුණු = 12**

| | | |
|---|---|---|
| (iv) | නිර්මාණශීලිත්වයේ අර්ථ සිද්ධි පිළිබඳ ජේම්ස් වොට්සන් සඳහන් කළ කරුණු **හතරක්** දක්වා ඉන් **දෙකක්** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. | (ලකුණු 16) |

- ගැටලු විසඳා ගැනීමට හේතුවීම
- පෙළඹවීමක් ඇතිකරවීම
- උද්යෝගීභාවයෙන් යුතු ක්‍රියාශීලීත්වයක් ඇතිකරවීම
- පවතින දෙයක් කෙරෙහි අභියෝගයක් ඇති කිරීමට උපකාරීවීම
- ගවේෂණාත්මකවීම
- කණ්ඩායම් කටයුතුවලට වැදගත්වීම
- සෙසු අයගේ නිර්මාණශීලීත්වය ඇගයුමට උපකාරීවීම .
- විවෘත හා නම්‍යශීලීවීම
- කාර්යය තෘප්තිය ඇතිකරවීම
- අදහස් පණ ගැන්වීමට හේතුවීම

**නම් කිරීම ලකුණු 1 x 4 = 04**
**විස්තර කිරීම ලකුණු 4 x 2 = 08**
**උදාහරණ දැක්වීම ලකුණු 2 x 2 = 04**
**මුළු ලකුණු = 16**



CamScanner

**2. (i)** යටත්විජිත සමයේ සිට දේශීය වශයෙන් වාර්තා හා කෙටි චිත්‍රපට නිෂ්පාදනයට මුල් වූ රාජ්‍ය ආයතනය නම් කරන්න. (ලකුණු 04)

රජයේ චිත්‍රපට අංශය (GFU) **ලකුණු = 04**

**(ii)** නිර්වාචික සන්නිවේදනයේ අංග **දෙකක්** නිදසුන් ඇසුරෙන් පහදන්න. (ලකුණු 08)

- ශරීර භාෂාව (මුහුණේ ඉරියව්, ඇස් සබඳතාව, අංග චලන ආදී..)
- සංකේත (සිතියම්, මාර්ග සලකුණු, වර්ණ ආදී..)
- සංඥා (ආලෝකය, බෙර හඬ, මාර්ග සංඥා..)

යනාදී කොටස්වලට අයත් අංග දෙකක් උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

**විස්තර කිරීම ලකුණු 2 x 2 = 04**
**උදාහරණ දැක්වීම ලකුණු 2 x 2 = 04**
**මුළු ලකුණු = 08**

**(iii)** මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

- ජනමාධ්‍ය මගින් ගොඩනැගීම
- තාක්ෂණය සමග ප්‍රබල සම්බන්ධයක් පැවතීම
- ගතික බව
- ව්‍යාපාරික ආධිපත්‍යයක් පැවැතීම
- ගෝලීයකරණය හා සමීප සබඳතාවක් පැවතීම
- කෘත්‍රිම අවශ්‍යතා නිර්මාණය කිරීම
- ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම
- පුද්ගල ආකල්ප හා චර්යාවන්ගේ වෙනස්කම් ඇති කිරීම
- නව ස්වරූපයක සමාජ රටාවක් ගොඩනැංවීම

**ලකුණු 4 x 3 = 12**

**(iv)** ඔබ තෝරාගත් ජනමාධ්‍යයක් ඇසුරෙන් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග **හතරක්** පිළිබඳ විග්‍රහ කරන්න. (ලකුණු 16)

- සන්නිවේදකයා
- ආකේතකරණය
- පණිවිඩය
- නාලිය/ මාධ්‍යය
- ග්‍රාහකයා
- විකේතකරණය
- ප්‍රතිපෝෂණය
- බාධක
- අත්දැකීම් පසුතලය
- සන්දර්භය
- බලපෑම

**සැ.යු. ජනමාධ්‍යයක් ඇසුරෙන් මූලිකාංග හතරක් විග්‍රහ කර තිබිය යුතුය.**

**ලකුණු 4 x 4 = 16**

3. මාධ්‍ය මගින් ග්‍රාහකයා කෙරෙහි ඇති කරන සෘණාත්මක බලපෑම් අවම කිරීමේ දී නීති පැනවීමට වඩා අප සියලුදෙනා වෙත වගකීමක් පැවරී ඇති බව ගුරුවරයා අවධාරණය කළේ ය.

(i) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 04)

- පෞරුෂ වර්ධනය
- තීරණ ගැනීම
- සිත හසුරුවා ගැනීම
- මතක තබා ගැනීම/ ස්මරණය
- විචාරශීලීත්වය වර්ධනය කරගැනීම
- ස්ව සංකල්ප පෝෂණය
- නිර්මාණශීලීත්වය ඔප්නංවා ගැනීම

**ලකුණු 2 x 2 = 04**

(ii) HUB ආකෘතියෙහි අන්තර්ගත පහත කරුණු කෙටියෙන් විස්තර කරන්න.
(අ) දොරටුපාලකයෝ
(ආ) බලපෑම් (ලකුණු 08)

(අ) දොරටුපාලකයෝ :

- ජනමාධ්‍ය තුළින් සංදේශයක් සමාජ ගතවීමට පෙර තේරීමට මැදිහත්වන පුද්ගලයින් දොරටුපාලකයින් ලෙස හැඳින්වේ
- කුමක් සන්නිවේදනය කරන්නේද? යන්න තීරණය කිරීම
- කෙසේ සන්නිවේදනය කරන්නේද? යන්න තීරණය කිරීම
- වැඩි අවධානයට හෝ අඩු අවධානයට හෝ එම ආකාරයෙන්ම සංදේශය ඉදිරිපත් කිරීමට මැදිහත් වීම
- සංදේශය සමාජගත වීම වැළකීමට ද ඉඩ ඇත

(ආ) බලපෑම්

ජනමාධ්‍ය සංදේශයන්ට නිරාවරණය වීම නිසා දෙයාකාරයක බලපෑම් ඇතිවිය හැකියි

1. පුද්ගලයා කෙරෙහි බලපෑම
2. සමාජය කෙරෙහි බලපෑම

බලපෑම සංකීර්ණ වූවකි. එය පුද්ගලයාගේ ආකල්ප හා චර්යාවන් වෙනස් කිරීමට හේතු විය හැකිය.

**ලකුණු 4 x 2 = 08**

(iii) සමාජ මාධ්‍ය මගින් සිදුවිය හැකි **සෘණාත්මක** බලපෑම් **තුනක්** උදාහරණ දක්වමින් විස්තර කරන්න.(ලකුණු 12)

- ගැඹුරු මානසික හා සමාජීය කම්පන ඇති කිරීම (මානසික අවපීඩනය, කනස්සල්ල, දරුණු හුදකලාව, සියදිවි නසා ගැනීම)
- පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලු මතුවීම
- අනවසරයෙන් පරිශීලක ගිණුම්වලට ඇතුළත්වීම
- සයිබර් හිරිහැර හා උවදුරු හා අපරාධ සිදුවීම
- ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම
- දූස් තොරතුරු පළ කිරීම/ ව්‍යාජ තොරතුරු සංසරණයවීම
- ව්‍යාජ ගිණුම් සැකසීම
- අසභ්‍ය වැඩසටහන්වලට නැඹුරුවීම
- ඇබ්බැහිවීම
- පුද්ගල අපහාස කිරීම් බහුලවීම
- ස්වකාමය (Narcissism)

**විස්තර කිරීම ලකුණු 3 x 3 = 09**
**උදාහරණ දැක්වීම ලකුණු 1 x 3 = 03**
**මුළු ලකුණු = 12**

(iv) 'සමාජ වගකීම වෙනුවෙන් නියාමනයේ අවශ්‍යතාව' යන මාතෘකාව යටතේ පහත නියාමන ආයතනයන්හි කාර්යභාරය සහ වගකීම් උදාහරණ සහිතව විස්තර කරමින් පුවත්පතකට **වචන 250ට** නොඅඩු ලිපියක් ලියන්න.

(අ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

(ආ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ලකුණු 16)

(අ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

- සෑම පුවත්පතක්ම මණ්ඩලයේ ලියාපදිංචි කරවීම
- පුවත්පත්වල වෘත්තීයභාවය ඉහළ නැංවීම
- පුවත්පත් නිදහස ආරක්ෂා කිරීම
- පුවත්පත් ආචාරධර්ම පවත්වාගෙන යාම
- පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- 1981 ආචාරධර්ම මාලාවට අනුගතව ආචාරධර්ම කඩකිරීම පිළිබඳ මහජන පැමිණිලි විභාග කිරීම
- සමාව අයැදීම් සහ නිවැරදි කිරීම් පළ කරවීම

(ආ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම

- විදුලි සංදේශ හා විදුලි සංදේශ කර්මාන්තය නියාමනය
- මහජන අයිතිය ආරක්ෂා කිරීම
- නව විදුලි සංදේශ ක්‍රමෝපාය ප්‍රවර්ධනය
- ගුවන්විදුලි, රූපවාහිනී විකාශන සංඛ්‍යාත පද්ධතිය බෙදාදීම
- අදාළ උපාංගවල ගුණාත්මකභාවය පිළිබඳව කටයුතු කිරීම
- දුරකථන භාවිතයේ දී ග්‍රාහකයන්ට මතුවන ගැටලු පිළිබඳ පැමිණිලි කිරීම හා ඊට අදාළ මෙහෙයුම් කටයුතු සිදුකිරීම

අන්තර්ගතය ලකුණු 7 x 2 = 14

පුවත්පත් ලිපියේ ආකෘතියට ලකුණු = 2

මුළු ලකුණු = 16

- [illegible]
- [illegible]
- [illegible]/chart
- end.
- [illegible]
- [illegible] } e-2

4. මාධ්‍ය සාක්ෂරතාව සහිත මාධ්‍යවේදීන් හා ග්‍රාහක පිරිසක් බිහි කිරීම පාසලෙන් ආරම්භ කළ යුතු බව මාධ්‍ය දින උත්සවයේ දී ආරාධිත කථිකයා ප්‍රකාශ කළේ ය.

(i) ජනමාධ්‍යයන්හි විශේෂ ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

- තාක්ෂණික මෙවලම් භාවිතය
- ක්ෂණික හා අඛණ්ඩතාවකින් යුක්තවීම
- සංවිධානගත ආයතන ව්‍යුහයකින් සමන්විතවීම
- වෘත්තිය සන්නිවේදකයින් සිටීම
- බහුවිධ දොරටුපාල ක්‍රියාවලියකට යටත්වීම
- බහුවිධ ග්‍රාහකත්වයකින් යුක්තවීම
- ප්‍රමාදිත ප්‍රතිපෝෂණයක් දක්නට ලැබීම
- මහජන සේවා හා/ හෝ වාණිජත්වය පදනම් කරගැනීම
- පොදු සංදේශ සම්ප්‍රේෂණය කිරීම
- සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර දුරස්ථ සම්බන්ධතාවක් පැවතීම

**ලකුණු 2 x 2 = 04**

(ii) සුපරීක්ෂණය හා අර්ථකථනය යන ජනමාධ්‍ය කාර්ය **දෙක** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

**සුපරීක්ෂණය (ආවේක්ෂණය)** - භෞතික හා සමාජීය තත්ත්වයන් පිළිබඳව නිරන්තර අවබෝධය යාවත්කාලීන කිරීම සුපරීක්ෂණය යි

- සමාජය තුළ ජීවත්වන පුද්ගලයා දැනගත යුතු තොරතුරු එක්රැස් කිරීම හා ලබාදීම
- ආරක්ෂණ තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම
- සමාජීය අවශ්‍යතා හඳුන්වාදීම
- ආපදා තොරතුරු එක්රැස් කිරීම හා ඒ පිළිබඳව සමාජය කඩිනමින් දැනුවත් කිරීම
- ආර්ථික, සමාජීය, දේශපාලන, සංස්කෘතික, පාරිසරික හා තාක්ෂණික ප්‍රවණතා හඳුන්වාදීම

**අර්ථකථනය** - යම් සංසිද්ධියක් පිළිබඳව ග්‍රාහකයාට විවරණාත්මකව පැහැදිලි කර දීම අර්ථකථනය යි

- සමාජීය ප්‍රතිචාර ලබා ගනිමින් තොරතුරු විශ්ලේෂණය කිරීම හා සංස්ලේෂණය කිරීම
- සිදුවීමකට අදාළ පසුබිම, බලපෑම ආදී කරුණු ඉදිරිපත් කිරීම

**ලකුණු 4 x 2 = 08**

(iii) උසස් මාධ්‍ය සාක්ෂරතාවක් ඇති කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** ගුවන්විදුලි මාධ්‍යයට විශේෂිතව විස්තර කරන්න. (ලකුණු 12)

- ගුවන්විදුලි මාධ්‍ය සංදේශ ලබා ගැනීමේ කැමැත්ත වැඩිවීම
- බලපෑම්වලට යටත් නොවී ගුණාත්මක බවින් ඉහළ වැඩසටහන් ගුවන්විදුලි මාධ්‍ය තුළ සොයා ගැනීමට පෙළඹීම
- විවිධ ආකෘති හා අන්තර්ගතයන්ගෙන් ඉදිරිපත් වන සංදේශ අවශ්‍ය ලෙස භාවිතයට යොමුවීම
- මානසික චාර්යා පද්ධතිය පාලනය කර ගැනීමේ හැකියාව ඇතිවීම
- ගුවන්විදුලි මාධ්‍ය සංදේශ වඩාත් විචාරශීලීව උකහා ගැනීමේ පරිචය ලබාගැනීම
- ගුවන්විදුලි මාධ්‍ය සංදේශවල උඩුපෙළ හා යටිපෙළ කියවා ගැනීමට හැකිවීම
- ගුවන්විදුලි මාධ්‍ය මගින් ඉලක්ක ගත කරන පරිභෝජනවාදයට හසු නොවීම
- ශ්‍රාවකයාගේ ස්වාධීන ඉලක්ක වෙත යොමුවීමට ගුවන්විදුලි මාධ්‍ය භාවිතය
- ගුවන්විදුලි මාධ්‍ය ආයතනයේ හිමිකාරීත්වය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය ලබා ගැනීම

**සැ.යු. උක්ත කරුණු ගුවන්විදුලි මාධ්‍යයට විශේෂිතව විස්තර කළ යුතුය.**

**ලකුණු 4 x 3 = 12**



CamScanner

(iv) විචාරශීලී ග්‍රාහකයකු සතුවිය යුතු පහත සඳහන් කුසලතා රූපවාහිනී මාධ්‍ය භාවිතයේ දී වැදගත් වන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(අ) විශ්ලේෂණය
(ආ) ඇගයීම
(ඉ) කාණ්ඩකරණය
(ඊ) වියුක්තිකරණය
(ලකුණු 16)

**(අ) විශ්ලේෂණය (Analysis)**

- රූපවාහිනී මාධ්‍ය සංදේශයක අන්තර්ගතව ඇති හෝ සංයෝග වී ඇති කොටස් තේරුම් ගත හැකි ආකාරයෙන් වෙන්කර ගැනීම
- සන්දේශයක අන්තර්ගත තොරතුරු ඒවායේ අර්ථ අනුව කොටස්වලට වෙන් කර ඉදිරිපත් වී ඇති ආකාරය විභාග කිරීම

**(ආ) ඇගයීම (Evaluation)**

- රූපවාහිනී මාධ්‍ය සංදේශයන්හි ගුණ, අගුණ සොයා බලමින් තක්සේරු කිරීම.
- ප්‍රවෘත්තියක හෝ තොරතුරක යෝග්‍යතාව තක්සේරු කිරීම.
- සංදේශයක අන්තර්ගත තොරතුරු යම් මිනුම් දණ්ඩකට හෝ ප්‍රමිතියකට සමාන කර හෝ සංසන්දනය කර බැලීම.

**(ඉ) කාණ්ඩකරණය (Grouping)**

- රූපවාහිනී මාධ්‍ය සංදේශ කාණ්ඩවලට බෙදා වෙන්කිරීම
- රූපවාහිනී වැඩසටහන්වල අන්තර්ගත කරුණුවල සමාන අසමාන කොටස් සංසන්දනය කිරීම
- වර්ගීකරණ රීතිය යොදා ගැනීම

**(ඊ) වියුක්තිකරණය (Abastraction)**

- රූපවාහිනී මාධ්‍ය සංදේශයන් හි හරය හා වැදගත් කරුණු ඉතා කෙටියෙන් පැහැදිලි ලෙස දැක්වීම

**සැ.යු. ඉහත කුසලතා රූපවාහිනී මාධ්‍ය භාවිතයේ දී වැදගත් වන ආකාරය උදාහරණ සහිතව විස්තර කළ යුතුය.**

**විස්තර කිරීමට ලකුණු 3 x 4 = 12**
**උදාහරණ දැක්වීම ලකුණු 1 x 4 = 04**
**මුළු ලකුණු = 16**



CamScanner

5. (i) පර්යේෂණවල දී යොදාගන්නා දත්ත වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

- ප්‍රමාණාත්මක දත්ත (Quantitative Data)
- ගුණාත්මක දත්ත (Qualitative Data)

**හෝ**

- ප්‍රාථමික දත්ත (Primary Data)
- ද්විතීයික දත්ත (Secondary Data)

**ලකුණු 2 x 2 = 04**

(ii) සංවර්ධනය පිළිබඳ නිර්වචනයක් දක්වා එය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

- "සංවර්ධනය යනු රටක දුප්පත්කම, අසමානතාව හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීම යි"
  *(ඩඩ්ලි සියර්ස් - 1969)*
- "සංවර්ධනය යනු මිනිසුන්ගේ සංවර්ධනය (මානව සංවර්ධනය) මිස, ද්‍රව්‍යමය සංවර්ධනයක් නොවේ යි" *(එඩ්ගා ඕවන්ස් - 1987)*
- "සංවර්ධනය යනු පූර්ණ සමාජ සංවර්ධනය යි. එයට මානසික, අධ්‍යාත්මික සහ ද්‍රව්‍යමය අවශ්‍යතා ඇතුළත් වේ" *(මහත්මා ගාන්ධි)*

**සැ.යු. මෙම නිර්වචන තුනෙන් එකක් පිළිබඳව විස්තර කර තිබිය යුතුය**

**නිවැරදිව නිර්වචනය සඳහන් කිරීම ලකුණු = 04**
**එම නිර්වචනය විස්තර කිරීම ලකුණු = 04**
**මුළු ලකුණු = 08**

(iii) සමීක්ෂණ ක්‍රමවේදය භාවිතයේ වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

- කෙටි කාලයකදී දත්ත රැස් කිරීමට හැකිවීම
- සාපේක්ෂව වියදම අවමවීම/ මූල්‍ය හා මානව සම්පත් අවම වශයෙන් භාවිතා කරමින් සිදු කළ හැක.
- අන්තර්ජාලය, සමාජ මාධ්‍ය ජාල, විද්‍යුත් තැපැල හා තැපැල භාවිතයෙන් දුර සිටින අයකුගෙන් වුවත් තොරතුරු රැස් කළ හැකිවීම
- දත්ත දායකයින් විශාල සංඛ්‍යාවකින් තොරතුරු ලබා ගත හැකිවීම
- මෘදුකාංග භාවිතයෙන් හෝ ශ්‍රමයිකව (Mannual) දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කළ හැකිවීම
- වඩා විශ්වසනීය ලෙස දත්ත විශ්ලේෂණය කළ හැකිවීම
- පුළුල් පරාසයක තොරතුරු එකවර රැස්කිරීමට හැකිවීම
- දෝෂ අවම කරගත හැකිවීම
- ක්ෂේත්‍ර ගණනාවක දත්ත එක් අවස්ථාවකදී ලබා ගත හැකිවීම
- සමීක්ෂණ ඔස්සේ බොහෝවිට සංඛ්‍යාත්මක දත්ත ලැබෙන බැවින් සාපේක්ෂව විශ්ලේෂණය කිරීම පහසුවීම

**ලකුණු 4 x 3 = 12**

(iv) පහත අවස්ථාවන්හි දී මහජන සම්බන්ධතා ක්‍රියාවලිය සිදුවන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
(අ) ආයතනික මහජන සම්බන්ධතා
(ආ) ව්‍යාපාරික මහජන සම්බන්ධතා (ලකුණු 16)

**(අ) ආයතනික මහජන සම්බන්ධතා -**
ආයතනයක අභ්‍යන්තර හා බාහිර පාර්ශ්ව සමග මහජන සම්බන්ධතා ක්‍රියාවලිය සිදුවන ආකාරය ලිවිය යුතුය.

එහිදී සේවකයෝ, ප්‍රජාව, රාජ්‍ය, මාධ්‍ය, පාරිභෝගිකයෝ/ ප්‍රතිලාභියෝ, ආයෝජකයෝ/ සම්පත්දායකයෝ සමග සබඳතා පවත්වමින් ආයතනයේ හොඳහිත හා මහජන ප්‍රතිරූපය ඉහළ නැංවීම ආයතනික මහජන සබඳතාවේ මූලික අරමුණයි. මෙහිදී පහත සඳහන් ක්ෂේත්‍ර ගැන අවධානය යොමු කෙරේ.

- ආයතනික කීර්තිය
- ආයතනය හා සම්බන්ධ පාර්ශ්වවල පිවිසුම
- විවිධ මත සාදන්නෝ
- මාධ්‍ය (ජනමාධ්‍ය, නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය)

**අභ්‍යන්තර -**

- ආයතනයේ කළමනාකාරිත්වය විසින් සේවක ප්‍රජාව විවිධ අයුරින් ඇගයීමට ලක්කිරීම (දීමනා, ත්‍යාග, සම්මාන, වැටුප් වර්ධක.....)
- සේවක සුබසාධන කාර්යයන් (විවාහ, අවමංගල්‍ය, විනෝද චාරිකා, විදෙස් ගමන්, වෛද්‍ය මධ්‍යස්ථාන, ආගමික කටයුතු, උපදේශන සේවා.....)
- අභ්‍යන්තර සන්නිවේදන උපක්‍රම භාවිතා කිරීම (පුවත් හසුන්, දැන්වීම් පුවරු, යෝජනා පෙට්ටි, විවිධ සන්නිවේදන යෙදවුම් භාවිත කිරීම, අභ්‍යන්තර ඇමතුම් පද්ධති.....)
- විනෝදාත්මක සහ ඉහිල්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (සුහද හමු, උපන්දින සාද, සංවත්සර, ක්‍රීඩා හා සංස්කෘතික වැඩසටහන්.....)

**බාහිර -**

- අනුග්‍රාහකත්වය
  (ආයතන මගින් බාහිර ප්‍රජාව වෙනුවෙන් ආගමික, සමාජීය, සංස්කෘතික කටයුතු සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම)
- ප්‍රදර්ශන (බාහිර ප්‍රජාව සමග සමීප සබඳතාවක් පැවැත්වීමට හැකිවීම)
- මාධ්‍ය නිවේදන නිකුත් කිරීම, මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම
- ප්‍රසන්න ආයතනික පරිසරයක් නිර්මාණය කිරීම (අසුන් පැනවීම, රූපවාහිනී යන්ත්‍ර ක්‍රියාත්මක කරවීම, මාළු ටැංකි ආදී පරිසර අලංකරණයන් භාවිතය යනාදී.....)
- සංග්‍රහයන් ලබාදීම (ආයතනයට පැමිණෙන මහජනතාවට)
- මුද්‍රිත, විද්‍යුත්, නව හා සමාජ මාධ්‍ය භාවිතය

**සැ.යු. අභ්‍යන්තර හා බාහිර යන කොටස් දෙකම පැහැදිලි කර තිබිය යුතුය.**

**(ආ) ව්‍යාපාරික මහජන සබඳතාව**

ලාභ ලැබීම අරමුණු කර ගනිමින් ව්‍යාපාරිකයින් විසින් ක්‍රියාත්මක කරන විවිධ උපක්‍රම මෙහි දී විස්තර විය යුතුය.

- නව භාණ්ඩයක් හෝ සේවාවක් හඳුන්වා දීම (දැන්වීම්, විශාල ප්‍රමාණයේ ප්‍රචාරක පුවරු (Billboards) ජංගම ප්‍රවර්ධන රථ, වෙළඳ ප්‍රදර්ශන, මාධ්‍ය සමුළු (Media conferences) මාධ්‍ය කට්ටල (Media Kit) ගෙයින් ගෙට යාම (Door to Door Visit))
- වෙළඳපොළ ප්‍රතිරෝධය ජය ගැනීම (වෙළඳ වට්ටම් ලබාදීම, විශේෂ ප්‍රවර්ධන අවස්ථා, තෑගි ලබාදීම, තිළිණ පත් ලබාදීම යනාදී...)
- ව්‍යාපාර පාර්ශ්වකරුවන් අතර ඇතිවන මතභේදාත්මක තත්ත්ව සමනය කිරීම (සුහද හමු, විනෝද චාරිකා, වාර්ෂික සමුළු, ප්‍රගති සමාලෝචන හමු, ප්‍රසාද දීමනා යනාදී..)
- ව්‍යාපාරික ආයතනයට ඇතිවන අයහපත් ප්‍රසිද්ධියක් මත ප්‍රතිරූපයට සිදුවන හානි අවම කිරීම, (ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම SCR, මාධ්‍ය සාකච්ඡා, ප්‍රවෘත්ති නිවේදන, විනෝද චාරිකා, ආයතනය පිළිබඳ ධනාත්මක ආකල්ප ඇතිවන ආකාරයේ සමාජ මාධ්‍ය පළ කිරීම් යනාදී.....)
- අනුග්‍රාහකත්වය ලබාදීම
- මුදල් ගෙවීමකින් තොරව සිදු කරන පළ කිරීම (advertorial)

**විස්තර කිරීමට ලකුණු 6 x 2 = 12**
**උදාහරණ දැක්වීම ලකුණු 2 x 2 = 04**
**මුළු ලකුණු = 16**

Media Kit - DVD, Pendrive

6. 'සිනමාව හා සමාජය' යන තේමාව යටතේ වැඩමුළුවක් සංවිධානය කිරීමට ඔබ පාසලේ මාධ්‍ය ඒකකය සැලසුම් කරයි.

(i) පිලිප් කොට්ලර් දක්වන සිද්ධි කළමනාකරණයට අදාළ සිද්ධි වර්ග **දෙකක්** ලියන්න. (ලකුණු 04)

- සමාජ හා ජීවන චක්‍ර සිද්ධි
- අධ්‍යාපන හා වෘත්තීය සිද්ධි
- ක්‍රීඩා හා විනෝදාත්මක සිද්ධි
- දේශපාලන සිද්ධි
- ඒකාබද්ධ/ සාමූහික සිද්ධි
- ආගමික සිද්ධි

**ලකුණු 2 x 2 = 04**

(ii) මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව **කරුණු දෙකක්** යටතේ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

- මහජන සාමය ආරක්ෂා කිරීම
- පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කොට පවත්වාගෙන යාම
- තාක්ෂණික ප්‍රමිතිකරණය
- විවිධ සන්නිවේදන ක්‍රමවේද ඵලදායීව භාවිතයට ගැනීම
- පොදු මහජන සන්නිවේදන ක්‍රම භාවිතයෙන් පුද්ගල අයිතීන් ආරක්ෂා කිරීම
- විවිධත්වය හා විශ්වීය වටිනාකම් ප්‍රවර්ධනය
- සන්නිවේදනයේ නිදහස ප්‍රවර්ධනය කිරීම
- සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් තොරතුරු වෙත ප්‍රවේශ වීම
- සන්නිවේදනයේ තාක්ෂණික සංවර්ධනය ඵලදායී ලෙස භාවිත කිරීම
- තොරතුරු යනු ආර්ථික සම්පතක් බැවින් එය කළමනාකරණය කිරීම

**ලකුණු 4 x 2 = 08**

(iii) ඉහත වැඩමුළුවට අදාළව සිද්ධි කළමනාකරුවෙක් ලෙස ඔබ කටයුතු කරන්නේ නම් ඔබගේ භූමිකාවට අදාළ කාර්ය **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

- සිද්ධි තේමාව/ ඉලක්කය හා අරමුණු හඳුනාගැනීම
- සැලසුම
- පිටපත ලිවීම
- මූල්‍ය පිරිවැය හා එය සැලසුම් කිරීම
- ඉලක්ක ගත කණ්ඩායම් හඳුනා ගැනීම
- ස්ථානයක් වෙන් කරගැනීම
- අදාළ අභ්‍යන්තර හා බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය ගොඩනැගීම
- අනුග්‍රාහක අවස්ථා සැලසුම් කිරීම හා ලබා ගැනීම
- ප්‍රවර්ධන කටයුතු සැලසුම් කිරීම
- ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් නිෂ්පාදනය
- පාරිභෝගික සේවා සැලසුම් කිරීම
- ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීම
- හදිසි අවස්ථා කළමනාකරණය
- කාර්යය සංවිධානය (සැරසිලි, සංග්‍රහ, ශබ්ද විකාශන කටයුතු යනාදී.....)
- න්‍යාය පත්‍රය සැකසීම - කාල වේලාවක් සැලසුම් කිරීම

**සැ.යු. වැඩමුළුවට අදාළව ලිවිය යුතුය**

**ලකුණු 4 x 3 = 12**



CamScanner

(iv) මෙම වැඩමුළුවේ දී සභාව ආමන්ත්‍රණය කරන්නෙකුට යොදා ගත හැකි සමූහ සන්නිවේදන විධික්‍රම **හතරක්** යෝග්‍ය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

- අරමුණු සහගත බව
- පෙර සූදානම
- වාචික මෙන්ම නිර්වාචික සන්නිවේදන ක්‍රම භාවිතය
- ආකර්ෂණීය කථන විලාසය
- ප්‍රදීපාගාර උපක්‍රමය
- ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය
- ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳ සැලකිලිමත් වීම
- කාල කළමනාකරණය
- වගකීම හා වගවීම

**සැ.යු. වැඩමුළුවට අදාළව ලිවිය යුතුය.**

**විස්තර කිරීම ලකුණු** 3 x 4 = 12
**උදාහරණ දැක්වීම ලකුණු** 1 x 4 = 04
**මුළු ලකුණු** = 16

7. (i) එවරට් එම්. රොජර්ස් හඳුන්වා දුන් සංවර්ධනයට අදාළ න්‍යාය නම් කරන්න. (ලකුණු 04)

නවෝත්පාදන විසරණය (Diffusion of Innovation) **ලකුණු 4 x 1 = 04**

(ii) සංවර්ධනය සඳහා සන්නිවේදනයේ දී 'අවශ්‍යතා කේන්ද්‍රීයත්වය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පහදන්න. (ලකුණු 08)

**සෞඛ්‍ය සේවා, පෝෂණය, සනීපාරක්ෂාව, මානව හිමිකම් සහ නවාතැන් වැනි විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීමට සංවර්ධනයේ දී සන්නිවේදනය පුළුල් ලෙස උපයෝගී කර ගැනීම**

**සැ.යු. ඉහත සංකල්පයට අදාළව පැහැදිලි කර තිබිය යුතුය.**

**ලකුණු 8 x 1 = 08**

(iii) 2003 බුද්ධිමය දේපල පනතට අනුව 'සාධාරණ භාවිතය' යොදා ගත හැකි පහත අවස්ථා නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.
(අ) විචාරය
(ආ) ඉගැන්වීම
(ඉ) ප්‍රවෘත්ති වාර්තාකරණය (ලකුණු 12)

**(අ) විචාරය**

- යම් කෘතියක අගය විශ්ලේෂණය කර දැක්වීම
- **කෘතියක්** පිරික්සීමෙන් විමර්ශනය කරමින් විග්‍රහාත්මකව එහි ඇති අගයන් පැහැදිලි කරදීම

**(ආ) ඉගැන්වීම**

- **දැනුම, ආකල්ප, කුසලතා, නිපුණතා යනාදිය ගොඩනැංවීමේ ක්‍රියාවලියට කිසියම් කෘතියක් උපයෝගී කර ගැනීම**

**(ඉ) ප්‍රවෘත්ති වාර්තාකරණය**

- **සමාජය දැනගත යුතු සාධකයක් ලෙස සමාජ ගත කිරීමට කටයුතු කිරීම**
- **කෘතිය සඳහා සමාජ අවබෝධය ගොඩනැගීම**

**සැ.යු. ඉහත කරුණුවලට අනුව සාධාරණ භාවිතය සඳහා කෘතියක් යොදා ගන්නා ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කළ යුතුය.**

**කරුණු තුන විස්තර කිරීම ලකුණු 3 x 3 = 09**
**නිදසුන් දැක්වීම ලකුණු 1 x 3 = 03**
**මුළු ලකුණු = 12**



CamScanner

| (iv) නිර්මහාපරිමාණකරණයේ ස්වභාවය මූලික කරුණු හතරක් ඇසුරෙන් පිරික්සන්න. | (ලකුණු 16) |
|---|---|

- මහා ග්‍රාහක කණ්ඩායම් වලින් මිදී කුඩා/ අල්ප පරාස විකාශන ක්‍රම (Narrowcasting) කොටස්වලට වෙන්වීම (වෘත්තිය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය, අධ්‍යාපන මට්ටම ආදී වශයෙන්)
- නිශ්චිත ඉලක්කගත කණ්ඩයමකට සන්නිවේදනය කිරීම (කාන්තා, පිරිමි, ළමා, වැඩිහිටි)
- විශේෂිත ක්ෂේත්‍ර අරමුණු කොටගෙන සන්නිවේදනයට යොමුවීම (ළමා, කාන්තා, ක්‍රීඩා, ප්‍රවෘත්ති, චිත්‍රපට, ගීත)
- අසමාන හා විවිධත්වයෙන් යුතු ග්‍රාහක ක්ෂේත්‍ර බහුල වීම
- සන්නිවේදන ක්‍රියාවලිය පුද්ගල කේන්ද්‍රීයත්වය (Personalcasting) දක්වා ගමන් කිරීම
- තම කැමැත්ත පරිදි සංදේශ ලබා ගැනීමට යොමු වීම

**ලකුණු 4 x 4 = 16**

***



CamScanner